# අංගම් පොර - සිංහලයන්ගේ සාම්ප්‍රදායික සටන් කලාව හඳුනා ගැනීම

## පසුබිම

සිංහල සාම්ප්‍රදායික සටන් කලාව පිළිබඳව කරන අධ්‍යයනයක දී මූලික ගැටළු කිපයකට මුහුණ දීමට සිදු වේ. එයට හේතුව අංගම් ශිල්පය හඳුනාගැනීමට ඇති දුෂ්කරතාවයයි. එයට හේතුව මෙතෙක් එම සටන් ශිල්පය පිළිබඳව සමාජගත වී ඇති ආකල්ප බව පෙනේ. එනම් අංගම් සටන් ශිල්පය පුරාණයේ පැවතියත් පසුව එය විවිධ හේතූන් නිසා විනාශ වී ගිය සටන් ශිල්පයක් වශයෙන් හෝ මරණය සඳහා භාවිතා කරන ඉතා මාරාන්තිය ම්ලේච්ඡ ප්‍රාථමික සටන් ශිල්පයක් වශයෙනුත් වෙනත් සටන් ශිල්පයන් තාක්ෂණික අංශයෙන් දියුණු සටන් ශිල්පයක් වන බවට ඇති මතයයි.

ඒ අනුව දැනට අංගම් ශිල්පය වශයෙන් ලංකාවේ භාවිතා වන සටන් ශිල්පයන් කීපයක් ම හඳුනාගත හැකිය. එනම්

1. සාම්ප්‍රදායික අංගම් සටන් කලාව
2. චීනඩි නමින් හැඳින්වෙන සටන් කලාව
3. චීනඩි සහ අංගම් සටන් කලාවේ යම් යම් කොටස් එකට එකතු කොට නිර්මාණය කර ගන්නා ලද සටන් කලාව
4. අංගම් සටන් කලාවේ කොටස් හා ඉන්දීය සටන් කලාව සමග සම්බන්ධ කර නිර්මාණය කරගෙන ඇති සටන් කලාව
5. වෙනත් සටන් කලාවන් හා සම්බන්ධ කර නිර්මාණය කර ඇති සටන් කලාව

සාම්ප්‍රදායික අංගම් සටන් කලාව පිළිබඳව කරන ගවේෂණයක දී මේ සියලු විස්තරයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වෙයි. විශේෂයෙන්ම සාම්ප්‍රදායික අංගම් සටන් කලාව මිශ්‍ර වී ඇති වෙනත් අංගම් යනුවෙන් හැඳින්වෙන සටන් වර්ගයන් පිළිබඳව මේ අධ්‍යයනයේ දී අප ප්‍රථමයෙන් ම එහි අන්තර්ගතය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## ඓතිහාසික අධ්‍යයනය

අංගම් කලාව සම්බන්ධයෙන් කරන ඓතිහාසික අධ්‍යයනයක් සඳහා මහාවංශය මෙන්ම ජනප්‍රවාදයන්හි දී මෙන්ම ලංකාව බටහිර ජාතීන්ගේ ආක්‍රමණයන් වලින් පසුව එම බටහිර ජාතිකයන් විසින් තබන ලද යම් යම් වාර්තා ඇසුරු කර ගත හැකිය

මුල් කාලීන ඉතිහාසය දෙස බැලීමේ දී මහාවංශයේ සඳහන් වන විස්තර අනුව ථෙරපුත්තාභය නම් යෝධයා විසින් පලිහ පමණක් භාවිතා කරන යම් විශේෂිත සටන් ක්‍රමයක් භාවිතා කරන ලද බවට විස්තර එයි. එසේම දුටුගැමුණු රජතුමාගේ දස මහා යෝධයන්ගේ විවිධ හැකියාවන් පිළිබඳව ඇති විමර්ශනාත්මකව බැලීමේ දී ඔවුන් සියලු දෙනාම යම් ආකාරයක සටන් පුහුණුවක් ලද බව පැහැදිලිය. එසේම ජනප්‍රවාද මගින් දැක්වෙන ප්‍රසිද්ධ ජයසේන නම් යක්ෂ සේනාපතියා සහ ගෝඨයිම්බර නම් යෝධයා අතර සිදු වූ සටන පිළිබඳව මහා වංශය විස්තරය විමසීමේදී යම් විශේෂිත පා පහරක් පිළිබඳව කියවෙයි. මීට අමතරව විවිධ සටන් පිළිබඳව විස්තර කෙරෙන අවස්ථාවලදී යම් ආකාරයක විධිමත්ව පුහුණු වූ විශිෂ්ට ආකාරයේ සටන් කලාවක් පැවති බවට තහවුරු වෙයි

මෙම සියලු සාක්ෂීන් අපට ලබා ගත හැකි වන්නේ අධ්‍යාහාරයෙන් වුවත් 16 වන ශත වර්ෂයෙන් පසුව බටහිර

ජාතීන්ගේ ආක්‍රමණ හමුවේ සිංහල සටන්කරුවන්ගේ අති දක්ෂ රණශූරත්වය පිළිබිඹු කරන අවස්ථා එවකට විසූ විවිධ විදේශිකයන් විසින් වාර්තා ගත කර ඇති අතර ඉහතින් දක් වූ අදහස ඉන් ඔබ්බට වර්ධනය කිරීමට එම විස්තරයන් පිටුවහලක් වෙයි. මේ පිළිබඳව විදේශීන් විසින් තබන ලද සටහන් කීපයකට පමණක් මෙහිදී අපගේ අවධානය යොමු කරමු.

සුදලියේ මුහන්දිරම් නිලමේ සුදලිය නම් වූ ද මරුවලියේ මුහන්දිරම් නිලමේ මරුවලිය නම් වූ ද කඩු හරඹ කණ්ඩායම් දෙකකට නායක වූහ. මේ වචනවල අර්ථ මට දැනගත නොහැකි විය. මේ යෙදුම ඒ ඒ ගණයේ මිනිසුන් සඳහා ද යොදන ලදී. මුල දී මුළු රට ම මේ දෙගණයට බෙදා තිබිණි. එක් කණ්ඩායමක ජයග්‍රාහකයෝ හැම විටම අනිකේ ජයග්‍රාහකයන්ට ට ප්‍රතිවිරුද්ධ වූහ. ඔවුහු මිටි ගුටි හෝ කඩු පලිස් මුගුරු හෝ උපයෝගී කොටගෙන හෝ ද්වන්දව සටන්වල යෙදුණෝය. මුලදී ඔවුහු ඛඩ්ග ධර මල්ලවයන්ට මෙන් රාජ සභාව අභිමුඛයෙහි තම දක්ෂතාවය ප්‍රදර්ශනය කලාහු විරුද්ධ පාර්ශ්විකයන් ගේ ලේ සෙල්වීමට හා ඔවුන්ට තුවාල කිරීමට යත්න දැරූහ. මෙබඳු සටන් නිසා භයානක සණ්ඩු දබර හා අරෝ වියවුල් රටවාසීන් කෙරෙහි පහළ වූ හෙයින් මේවා නතර කරන ලදී. එක් එක් ගණයට අයත් කඩු හරඹ නායකයෝ දස දෙනෙක් රටේ ඒ ඒ තැන්වල සිට තම ශිල්ප ක්‍රමය ආධුනිකයන්ට ඉගැන්වූහ යනුවෙන් ඩේවි දුටු ලංකාව නමින් ඇල්ලේපොල එම් සෝමරත්න විසින් සිංහලයට පරිවර්තනය කරන ලද An account of the Interior of Ceylon and of its Inhabitants, with travel in that Island නම් ග්‍රන්ථයේ 150 වන පිටුවේ දක්වා ඇති සටහනේ දැක්වේ.

මහා බ්‍රිතාන්‍යයේ කෞතුකාගාරයේ ඇති ලංකාවෙන් රැගෙන ගිය පුස්කොළ පොත් සමූහයේ තිබූ කවි 203 කින් යුත් මග සලකුණ නම් 1974 දී එඩ්මන්ඩ් පීරිස් දේවගැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද කාව්‍ය සංග්‍රහයේ බදුල්ලේ සිට මහනුවර දක්වා ඇති මාර්ග විස්තරයක් වර්ණනා කිරීමේ දී සෙංකඩගල නුවර ආශ්‍රයේ පැවති ඇගේ මැඳුල්ල නම් වු සටන් පුහුණු වන ආයතනයක් ගැන පහත සඳහන් පරිදි දක්වා තිබේ.

ගම් බිම් පිණිස ඇවිදින් එක රාසිය ට
නම් ගම් කිය කියා උනුනුන් වේග කො ට
අංගම් පොර අරින පෙර සෙබළුන් එවි ට
අංගම් මැඩිල්ලෙන් එළ බස වි සතු ට (182 කවිය)

මෙම සටහන් දෙකට අමතරව ඇති සාක්ෂි බොහොමයක්ම පදනම් වී ඇත්තේ ඉංග්‍රීසින්ගේ පාලන කාලයේ ප්‍රධාන කොට පැවති අංගම් ශිල්පීන් ප්‍රධාන ගුරුකුල දෙකකට බෙදා පැවතිය බවත් එනම් සුදලිය සහ මරුවල්ලිය වශයෙන් බවත් වූ මතය අනුව අංගම් ශිල්පයේ ඉතිහාසය 19 වන ශත වර්ෂයේ මුල් කාලයට සීමා වී තිබුණත් ඉන් ඔබ්බට යන ලිඛිත ඉතිහාසයක් පිළිබඳ තොරතුරු රාජවලියේ සඳහන් වෙයි. එහි දැක්වෙන සීතාවක රාජසිංහ රජතුමා හා පෘතුගීසින් අතර ඇති වූ යුද්ධය වූ මුල්ලේරියා සටන යනුවෙන් ප්‍රකට වූ යුද්ධයෙන් සිංහල රණ ශූරයන්ගේ දක්ෂතාවයන් හා ගැටුණු 1600 ක් පමණ පෘතුගීසි සේනාවේ ඉරණම රාජාවලියේ දැක්වෙන්නේ ..... රාජසිංහ රජු අසුට නැගී විහිදුවා සේනාව වටකර දුවමින් රණයුද ගිනිකෙළි කෙළ කොටන විට දුරුතු මස මීහිදුම් මෙන් වෙඩිදුම් පටලාගෙන සිටින සඳ මුල්ලේරියාවේ වෙල මැද ලේ වතුරු කොට ප්‍රතිකාල් සේනාවට අඩියක්වත් පස්සට යන්ඩ නැර කොටා එක්දාස් සත්සියයක් ප්‍රතිකානුන් හා කෝට්ටේ සේනාවගෙන් කීප දෙනෙකුත් පඬත්තලවරුන් කීපදෙනෙකුත් කොටා වැටුණාහ.... යනුවෙනි

විශේෂයෙන් ම සීතාවක යුගයේ රචනා කරන ලදැයි කියවෙන සීතාවක සටන නම් වූ පුස්කොළ ග්‍රන්ථයේ සිංහල සටන් ශිල්පීන්ගේ දක්ෂතාවයන් පිළිබඳව මැනවින් වර්ණනා කර තිබේ. එය නිරීක්ෂණය කරන්නෙකුට සිංහල අංගම් ශිල්පීන්ගේ

හැකියාවන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැකිය. ක්‍රි.ව. 1615-1687 දක්වා රජකම් කළ 2 වන රාජසිංහ රජතුමාගේ සටන් පිළිබඳව විස්තර වන "ශ්‍රී රාජසිංහ වර්ණනාව නම් ග්‍රන්ථයේ ද රාජසිංහ රජතුමාගේ සටන් පිළිබඳව ඇති විස්තරය බැලීමේදී පෙනී යන්නේ එයින් ද අංගම් සටන් පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් අඩංගු කර ඇති බවයි.

මෙම සාක්ෂිවලට අමතරව තවත් ග්‍රන්ථයන් රාශියකම මෙන්ම ඇම්බැක්කේ, දළදා මාලිගාව, පනාවිටිය අම්බලම, රිදී විහාරය ආදී ස්ථාන රාශියකම අංගම් ශිල්පීන්ගේ ඉරියව් නිරූපණය කරන ලී කැටයම් හා චිත්‍ර දැකීමට හැකිය. මෙම ඓතිහාසික සාක්ෂි මගින් යම් ආකාරයට තාක්ෂණික යුද්ධ සටන් ක්‍රමයක් භාවිතා වුනු බවට අදහසක් ඇති කර ගැනීමට ප්‍රමාණවත් වෙයි. එහෙත් ඒ භාවිතා කරන ලද තාක්ෂණික යුද්ධ සටන් ක්‍රමය කුමක්ද? යන ප්‍රශ්නයට එය අංගම් පොර යනුවෙන් හඳුනාගත හැකි බව එම කාලයේ රචිත ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර ගත හැකි වුවත් ඉන් ඔබ්බට යාම අතිශයින් දුෂ්කර වෙයි. ඒ සඳහා සාම්ප්‍රදායික අංගම් සටන් කලාවේ භාවිතා කරන ක්‍රමවේදයන් හා එම දැනුම නිරීක්ෂණය කිරීම වැදගත් වෙයි.

## අන්තර්ගතය

ඉහතින් දක්වන ලද ඓතිහාසික සාක්ෂි පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ඉන් මතුවන අංගම් ශිල්පය කුමක්ද? එහි අඩංගු වන්නේ කුමක්ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ අනුව සාම්ප්‍රදායික අංගම් සටන් කලාව ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එනම්

අංගම්

ඉලංගම්

මායා අංගම්

වශයෙනි. මෙහිදී අංගම් යනුවෙන් හැඳින්වෙන්නේ අත හා පය උපයෝගී කරගෙන කරන සටන් විශේෂයකි. එය නැවතත් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

ගුටි හරඹ / පොර හරඹ

ගුටි හරඹයේදී අත හා පය උපයෝගී කරගෙන පහර දීමක් සිදු කරනු ලබයි. පෙර හරඹයේදී පහර දීමක් නොකර පොර බැදීමක් සිදු කරයි. ඉලංගම් යනුවෙන් හැඳින්වෙන්නේ අවි ආයුධ වලින් කරන සටන් වෙයි.

## ඉලංගම්

අංගම් ශිල්පයේ භාවිතා වන ආයුධ පිළිබඳව බොහෝ ඓතිහාසික මූලාශ්‍රවල මෙන්ම ජනප්‍රවාදගත සාක්ෂි මගින් ද ලැබෙන පිටුවහල ප්‍රමාණවත් නැත. මේ හේතුව නිසා බොහොමයක් පුද්ගලයන් විවිධ ආකාරයෙන් මෙම ශිල්පයේ භාවිතා වන ආයුධ පිළිබඳව අදහස් දක්වා තිබේ. උදාහරණ වශයෙන් සමහර පුද්ගලයන්ට අනුව ප්‍රධාන ආයුධ වර්ග 5 ක් පමණක් භාවිතා වන බවට ද අනෙක් ආයුධ විනාශ වී ඇති බවටද මතයක් ඇත. මේ සියල්ලට හේතුව වන්නේ සාම්ප්‍රදායික අංගම් ශිල්පය පිළිබඳව ඇති නොදැනීම විනා අන් හේතුවක් නොවේ. අංගම් සටන් කලාවේ වර්ධනය පිළිබඳව සලකා බැලීමේ දී අපට පෙනී යන්නේ මුල් කාලයේ පැවති ආයුධ හා ඒවා භාවිතා කිරීමට යොදා ගන්නා ශිල්ප ක්‍රමය පසු කාලීනව ක්‍රමිකව වර්ධනය කර ගනිමින් ඉතා උසස් ක්‍රමවේදයක් නිර්මාණය කර ගෙන ඇති බවයි. මෙහිදී විශේෂයෙන් කිව යුත්තේ ආයුධ වර්ග නම් කිරීම පමණක් නොව ඒවා භාවිතා කරන ආකාරය ද ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් ද හැදෑරීම කළ යුතු බවයි. අවාසනාවකට දැනට අංගම් ශිල්පීන් යැයි හඳුන්වා ගන්නා අය හට මෙම ආයුධ පිළිබඳව හා ඒවා භාවිතා කරන ආකාරය පිළිබඳව මූලික දැනුමක් වත් නොමැති බව පෙනේ. උදාහරණ ලෙස සුරුට්ටුවාල් යනුවෙන් හැඳින්වෙන ආයුධය වේලායුධය නමින් භාවිතා කරන අවස්ථා දැකිය හැකිය.

මේ අනුව පරිපූර්ණ අංගම් ශිල්පයේ අවි ආයුධ වර්ග 21 ක් අනිවාර්යයෙන්ම පුහුණු විය යුතුය. එහි සංකල්පීය අදහස නම් අංගම් ශිල්පියා තමාගේ අතට හසුවන ඕනෑම දෙයක් ආයුධයක් බවට පත් කර ගත යුතුය යන අදහසයි. ඒ අනුව සාම්ප්‍රදායික අංගම් ශිල්පයේ කඩුව, රිට, මුගුර, සිරිය, කිණිස්ස, හෙල්ල, නෙත්ති, කුන්ත, ත්‍රිශූලය, මරුවැල, ඔම්මට්ට, උම්මට්ට, යගදාව, පලිහ, කලාකිරිසඳක්ද, දුන්න, තෝමරය, පොරව, කෙටේරිය, සුරුට්ටුවාල්, පට්ටවාල් එම ආයුධ වේ. මීට අමතරව සමහර අංගම් ගුරු කුළ විසින් වර්ධනය කර ගන්නා ලද රහසිගත ආයුධ වර්ගයනුත් පවතී.

## මායා අංගම්

මායා අංගම් යනුවෙන් මෙහිදී හැඳින්වෙන්නේ යන්ත්‍ර හා මන්ත්‍ර පිල්ලි උපයෝගී කර ගෙන කරනු ලබන්නකි. මෙහිදී භාවිතා වන මන්ත්‍ර ආදිය සිංහල යන්ත්‍ර මන්ත්‍ර වුවත් අංගම් ශිල්පයට ආවේණික වූ යන්ත්‍ර මන්ත්‍ර වෙයි. සාමාන්‍ය ලෙඩරෝග සඳහා ඉක්මනින් සුවය ලැබීමට භාවිතා කරන මන්ත්‍රවල පටන් පිල්ලි යැවීම දක්වා ම භාවිතා වෙයි. විශේෂයෙන්ම මෙහිදී අංගම් පිඹීම යනුවෙන් හඳුන්වන මන්ත්‍ර ශාස්ත්‍රය උපයෝගී කරගනෙ කටින් කරන පිඹීමක් උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මේ සියල්ල සිංහල මන්ත්‍ර ශාස්ත්‍රය හා මනා කොට බැඳී පවතියි.

## වෙදකම හා ජ්‍යොතිෂ්‍යය

මනා කොට පුහුණුව ලද අංගම් ශිල්පියා හොඳ වෛද්‍යවරයෙක් වෙයි. ශරීරයේ ඇති වන සුලු තුවාල, උලුක්කුවල සිට දරුණු ආකාරයේ රෝගාබාධ සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය වෙද දැනුම දැන සිටිය යුතුය. ඒ අනුව අංගම් ශිල්පීන්ට අවශ්‍ය තෙල්, බෙහෙත් නිපදවා ගැනීමට මෙන්ම විවිධ ලෙඩ රෝග සඳහා භාවිතා කරනු ලබන විවිධ ශාක වර්ගයන් පිළිබඳව මනා දැනීමක් ලබා දෙනු ලබයි. විශේෂිත වූ තෙල් වර්ග භාවිත කරමින් ශරීරයේ නිල පද්ධතිය හරහා ශරීරය ශක්තිමත් කිරීම ද සිදු කිරීමට අවශ්‍ය දැනුම ලබා දෙනු ලබයි. මීට අමතරව අංගම් ශිල්පියෙක් ජ්‍යොතිෂ්‍යය පිළිබඳව දැනුමක් ලබා සිටිය යුතුය. වේලාපත්කඩක් බැලීමට මෙන්ම මරු සිටින දිසාව අමෘත කලාව චන්ද්‍රමාස ක්‍රමය නැකැත් ශාස්ත්‍රය පිළිබඳව මනා දැනුමක් ලබා දීම ද අංගම් ශිල්පයේදී සිදුවෙයි. යුද්ධ වලදී මෙන්ම සාමාන්‍ය සටන් වලදී අංගම් ශිල්පියාට මෙම දැනුම අතිශය වැදගත් වෙයි.

## සංගීතය

සංගීතය සඳහා අංගම් ශිල්පයේ ප්‍රමුඛ තැනක් හිමි වෙයි. මෙයට හේතුව අංගම් ශිල්පයේ එන හරඹ වලට මෙන්ම දෙදෙනෙක් අතර සිදු කරන සටන් වලදී ද යුද්ධවලදී ද සංගීත භාණ්ඩ සමග එකට එම සටන් සිදු වී තිබීමයි. විශේෂයෙන්ම මෙහිදී මූලික සංගීත භාණ්ඩ වශයෙන් යක් බෙරය, ගැට බෙරය, හොරණෑව, දවුල සහ තම්මැට්ටම භාවිතා වන අතර මේවා පුහුණු වීම් කරන ලද්දේ ද ඉලංගම් මඩුව තුළ ම වීම විශේෂත්වයකි. සටන් වලදී රණ බෙර වාදනය කරමින් සටන් කිරීම කැපී පෙනුණි. සාම්ප්‍රදායික අංගම් ශිල්පියාට මෙම සංගීත භාණ්ඩ වාදනය පිළිබඳ මනා දැනුමක් ලබා දෙනු ලබයි

## නිල ශාස්ත්‍රය

සිංහල අංගම් ශිල්පයේ ඉතා වැදගත් මෙන්ම කේන්ද්‍රගතව පවතින ශාස්ත්‍රය වන්නේ මරු නිල ශාස්ත්‍රයයි. මෙම මරු නිල ශාස්ත්‍රය සාමාන්‍යයෙන් ගුරුතුමා විසින් ශිෂ්‍යයන්ට ලබා දෙන්නේ ඉතා දැඩි නීතිරීති පද්ධතියකින් පසුවයි. මෙහිදී

ප්‍රධාන නිල 108 ක් ගැන කියැවෙයි. එම නිල විසඳෙ නිල හෙවත් සිහි නැතිවෙන නිල කාල නියම නිල හෙවත් කල් ගොස් මියයන නිල මාරු නිල හෙවත් නිශ්චිත දිනයක දී මැරෙන නිල සහ මරු නිල හෙවත් එම මොහොතේම මියයන නිල වශයෙන් කොටස් හතරකට බෙදනු ලබයි. මෙම නිල අතර මරු නිල 9 ක් ඇති අතර එම නිල වලට පහරක් වැදුණහොත් සුව කළ නොහැකි අතර අන් සෑම නිලයකටම වදින පහරක් තවත් නිලයක් උපයෝගී කර සුව කළ හැකිය. මෙම නිල ශාස්ත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී එය චීන නිල ශාස්ත්‍රයට මෙන්ම ආයුර්වේදයේ භාවිතා වන නිල ශාස්ත්‍රයට මෙන්ම ඉන්දීය සටන් කලාවේ නිල ශාස්ත්‍රයට මෙන්ම සිංහල සාම්ප්‍රදායික විදුම් පිලිස්සුම් ක්‍රමවල භාවිතා වන නිල ශාස්ත්‍රයට වඩා වෙනස් වේ. විශේෂයෙන්ම මෙහිදී සඳහන් කළ යුත්තේ ඉතා දැඩි නීති රීති පද්ධතියකට යටත්ව බවයි. නමුත් මෙම නිල ශාස්ත්‍රයේ දී ඉහතින් දක් වූ පරිදි මෙම නිල ශාස්ත්‍රය චීන නිල ශාස්ත්‍රයට බෙහෙවින්ම වෙනස් වුවත් අද එම චීන නිල ශාස්ත්‍රය චීනඩි ශිල්පය හා මිශ්‍ර කොට අංගම් යනුවෙන් භාවිතා කරන බව පෙනේ. මෙයට අමතරව ආයුර්වේද නිල ශාස්ත්‍රය ද භාවිතා කරන බව පෙනේ.

අංගම් සටන් ශිල්පියා භාවිත කරන ඇඳුම් පිළිබඳව සලකා බැලීමේ දී විශේෂයෙන්ම පැරණි සිංහලයා බොහෝ විට උඩුකය නිරුවත්ව වැඩ කටයුතු කළ බව මෙහිදී සිහිපත් කළ යුතුය. ඒ අනුව අංගම් ශිල්පීන් ද තම ශිල්පීය ඇඳුම් වශයෙන් විශේෂ යුද්ධ ඇඳුම් භාවිතා නොකරන ලද අවස්ථා වලදී දණහිසෙන් ඉහළට කෙටි සුදු පැහැති "මල්වාටිය" යනුවෙන් හැඳින්වෙන ඇඳුමක් භාවිතා කරන ලදී. නමුත් නුවර යුගයේ දී සමහර අවස්ථාවලදී ප්‍රභූන් කච්චිය භාවිතා කරන ලද බවට සාක්ෂි තිබේ. යුද්ධ සඳහා බොහෝ විට "කච්ච" යනුවෙන් හැඳින්වෙන පපු ආවරණ සහ ශරීරයේ මර්මස්ථාන වැසෙන සේ විවිධ ආවරණ භාවිත කරන ලද බවත් හිස් වැස්ම සඳහා "ඉස්පයිය" යනුවෙන් හැඳින්වෙන හිස් ආවරණයක් භාවිතා කරන ලද බවත් පෙනේ. මෙම යුධ ඇඳුම් පිළිබඳව අදහසක් ලබා ගැනීමට හොඳම උදාහරණය වන්නේ උඩරට නැටුම් ශිල්පියාගේ ඇඳුම් කට්ටලයයි. එම ඇඳුම් කට්ටලය පැරණි සිංහල යුධ ඇඳුම මැනවින් සංකේතවත් කරන්නකි.

## නැටුම් කලාව හා ඇති සමරූපීතාවය

මෙය සුවිශේෂ කරුණක් වශයෙන් මෙහිදී සඳහන් කළ යුතුය. එනම් නැටුම් කලාවේ එන බොහෝ අත් සරඹ හා පා තැබීම් රටාවන් මෙන්ම විවිධ පිනුම් හා අත් පා චලනය කිරීමේ ඉරියව් රාශියක් අංගම් ශිල්පයේ එන ඉරියව් රාශියකට සමාන වෙයි. විශේෂයෙන්ම උඩරට වෙස් නැටුමෙහි භාවිතා වන ඇඳුම් කට්ටලය පැරණි සිංහල යුධ සෙබලකු විසින් භාවිතා කරන ලද යුධ ඇඳුම සංකේතවත් කරන්නක් වෙයි. එපමණක් නොව නැටුම් ශිල්පයේ භාවිතා වන වචන පවා අංගම් ශිල්පයේ වචනවලට සමාන වන අවස්ථා රාශියක් දැකිය හැකිය.

## චාරිත්‍ර වාරිත්‍ර

ශිෂ්‍යයා සටන් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේ සිට අවසානය දක්වාම ඉතා දැඩි චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම බෞද්ධාගමික වත් පිලිවෙත් මත අංගම් ශිල්පය පදනම් වී ඇත. බුදුන් වහන්සේට සහ දෙවි දේවතාවුන් වහන්සේලා වැඳ පිදීමෙන් පසුව ශිල්පය පුහුණු වීම පුහුණු කිරීම මෙන්ම හරඹ දැක්වීම ආරම්භ වීම සිදු වන අතර ශිල්පයේ විවිධ අවස්ථාවලදී සාම්ප්‍රාදයික සිංහල ආචාර ක්‍රමය වූ දැත් එක්කොට වැඳීම දැකිය හැකිය.

## සම්පිණ්ඩනය

ඉහතින් ඉතා කෙටියෙන් දක්වන ලද අන්තර්ගතයන් වලින් පෙනී යන්නේ සාම්ප්‍රදායික අංගම් සටන් කලාවට

අඩංගු කොටස් වෙයි. මෙම කොටස් ඒ ආකාරයෙන්ම ලංකාවේ භාවිතා කරන අංගම් ශිල්පීන් ඉතා දුර්ලභය. එයට හේතූන් රාශියක් දැකිය හැකිය. විශේෂයෙන්ම සාම්ප්‍රදායික සටන් කලාව අංගසම්පූර්ණ වශයෙන් හදාරන ලද ශිල්පීන් දැකිය නොහැකි වීමයි. සමහරුන් ඉන් කොටස් පමණක් හදාරා එය වර්ධනය කර තිබේ. නමුත් වඩාත් අනතුරුදායක තාවය ඇති වී ඇත්තේ එයින් නොවේ. මෙම අධ්‍යයනයේ මුලින් දක්වන ලද වෙනත් සටන් කලාවන් හා මිශ්‍ර වී හා වෙනත් සටන් කලාවන් විශේෂයෙන්ම චීනඩි නම් සටන් කලාව අංගම් සටන් කලාව යනුවෙන් හඳුන්වා දෙමින් ඉදිරිපත් කරන සටන් ශිල්පීන් නිසා ඉතා වැරදි ආකාරයක අදහසක් සමාජගත වීමේ අනතුරයි. මේ වන විටත් එවැනි අදහසක් සමාජගත වී ඇති බව දක්නට ඇත.

සාම්ප්‍රදායික සටන් කලාවේ අනන්‍යතාවය පිළිබඳව සලකා බැලීමේදී විවිධ මතවාදයන් පසුකාලීනව ඇති වී තිබුණද මෙය මෙරටට අනන්‍ය වූ තවමත් විනාශ නොවී අප්‍රකටව පවතින දේශීය සම්ප්‍රදාය මත පදනම් වූ සටන් කලාවක් පවතිව බව පැහැදිලිය. විශේෂයෙන්ම ඉංග්‍රීසින්ගේ කාලයේ පනවන ලද අණ පණත් සහ නියෝග මෙම සටන් කලාව දැඩි මර්දනයටත් සටන් කලා ශිල්පීන් විනාශ කිරීමටත් කටයුතු කිරීම මෙන්ම සටන් ශිල්පයේ ආරක්ෂාව සඳහා එවකට සිටි සටන් ශිල්පීන් එම ශාස්ත්‍රය රහසිගත ආකාරයෙන් පවත්වාගෙන යාම අංගම් සටන් වල යම් යම් කොටස් නැටුම් කලාව ආදියට මිශ්‍ර කිරීම සහ රහසිගත ආකාරයට පුහුණුවීම හේතුවෙන් පසුකාලීනව වෙනත් සටන් කලාවන් සමග මිශ්‍ර කොට එය අංගම් පොර යනුවෙන් ප්‍රචලිත කිරීමට උත්සාහ දරන කොටස් බිහිවීම මෙමගින් අවසාන ප්‍රතිඵලය වශයෙන් දැනට දැකිය හැක්කේ සාම්ප්‍රාදයික අංගම් සටන් කලාව යහපත් කොට අංගම් සටන් වශයෙන් හඳුන්වමින් වෙනත් මිශ්‍ර සටන් කලාවන් ඉදිරිපත් කිරීමයි. මෙය සාම්ප්‍රදායික දැනුම් පද්ධතියක් විනාශ විමට යාමේ පළමු පියවර විය හැකිය.

ඉහත දක්වන ලද සියලු කරුණු සම්පිණ්ඩනය කර බැලීමේ දී සාම්ප්‍රදායික අංගම් ශිල්පයේ අංග සම්පූර්ණ දැනුම් පද්ධතියේ අංගයන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගත හැකිය. මේ අනුව අංගම් ශිල්පියා පරිපූර්ණ අංගම් ශිල්පියෙකු විමට ඉහතින් සඳහන් කරන ලද අංගයන් අනිවාර්යයෙන් අන්තර්ගත විය යුතුය. සාම්ප්‍රදායික අංගම් ශිල්පය හඳුනා ගැනීමේදී මුලින්ම අංගම් සටන් කලාව පිළිබඳව අප සතුව පවතින ආකල්ප පිළිබඳව වෙනසක් සිදුකරගත යුතුය. දෙවැනිව සැබෑ අංගම් සටන් කලාව එම සටන් කලාව හා බැඳී පවතින සංස්කෘතිකාංග ආශ්‍රය කරගෙන අවබෝධ කර ගත යුතුය. ඒ සඳහා සාම්ප්‍රදායික සිංහල සංස්කෘතිය තුළ ඇති සංස්කෘතිකාංග හරහා එම අධ්‍යයනය කළ යුතුය. සැබෑ අංගම් සටන් කලාව තවදුරටත් රහසිගත හා ගුප්ත සටන් කලාවක් බවට පත් කොට එය යටපත් කර දැමීමට කරන උත්සාහය වැලැක්වීම සඳහා දරණ උත්සාහයන් යටපත් කොට අපට අනන්‍ය සටන් කලාව ඉදිරියට ගෙන යාමට සාම්ප්‍රදායික සටන් කලාව පිළිබඳව නිවැරදි අවබෝධය සමාජයට ලබා දීම වැදගත් කාර්යයක් වෙයි.

අංක 1- ඇම්බැක්කේ ලී කැටයමක දක්වෙන මෙම මල්ලවයන් දෙදෙනා කලාකිරිසඳැඳය නැමති ආයුධය භාවිතා කරමින් අංගම් ශිල්පයේ එන ගැට පුට්ටුවක් දමාගෙන සිටින අයුරු දිස්වෙයි.

අංක 2- ඇම්බැක්කේ ලී කැටයමක දැක්වෙන මෙම යුධ සෙබලා පලිහක් හා කඩුවක් අතින් අරගෙන සිටින අතර හිසට ආවරණයක් පැළඳගෙන සිටියි. එය ඉස්පයිය යනුවෙන් හඳුන්වනු ලබයි.

අංක 3- අංගම් ශිල්පයේ භාවිතා වන ආයුධ.

අංක 4- සාම්ප්‍රදායික මල්වාට්ටිය යනුවෙන් හැඳින්වෙන අංගම් සටන් ශිල්පීන් භාවිතා කරන ඇඳුම පැළඳ සටන් කරන පාරම්පරික අංගම් ශිල්පීන් දෙදෙනෙක්

## ආශ්‍රිත ග්‍රන්ථ


1. රාජාවලිය - ඒ. වී සුරවීර සංස්කරණය, 227 පිටුව
2. ශ්‍රී රාජසිංහ වර්ණනාව - සංස් - චන්ද්‍රසිරි ලියනගේ
3. මගසළකුණු - ප්‍රකාශනය - එඩ්මන්ඩ් පීරිස් - 1974
4. සීතාවක සටන - සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය
5. ඩේවි දුටු ලංකාව - පරි - ඇල්ලේපොල එම්. සෝමරත්න
6. සිංහල ත්‍රාසජනක ක්‍රීඩා - දැරණියගල



අජන්ත පෙරේරා
අංක 160/1, රාජසිංහ මාවත
කොරතොට - කඩුවෙල.